# රාජ්‍ය නොවන සංවිධාන කිලිනොච්චියේ කුමක් කරන්නේ ද?

රාජ්‍ය නොවන සංවිධාන හා ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන කිලිනොච්චියෙන් පිටවී යෑමට මෙතරම් කල් ගන්නේ ඇයි? නැතහොත් පිට වී නොයන්නේ ඇයි? අද මෙරට ක්‍රියාත්මකවන බොහෝ රාජ්‍ය නොවන සංවිධාන, විශේෂයෙන් ම ඊනියා ගැටුම් නිරාකරණ හා සාම දූත රාජ්‍ය නොවන සංවිධාන ජාත්‍යන්තර මුදලින් පවත්වාගෙන යන ආයතන වෙයි. ඒ අරුතින් ගත්කල ලංකාවේ පමණක් ඇතැම් විට ලියා පදිංචි වී සිටිය ද, මේ රාජ්‍ය නොවන සංවිධාන ද ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන වෙයි. එබැවින් මේ ලිපියෙහි මෙතැන් සිට මේ සියළු සංවිධාන ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන ලෙස හැඳින්වෙයි. ආණ්ඩුව ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධානවලට සම්බන්ධ කිලිනොච්චියෙහි කුලියට වැඩ කරන්නන්ට, අවශ්‍ය නම් සේවකයන්ට, කිලිනොච්චියෙන් පිටවීමට කියා සිටියේ දැනට සති කිහිපයකට පෙර ය. රාජ්‍ය නොවන කුලී කරුවෝ කිලිනොච්චියෙන් පිටවීමට සූදානම් වූහ යැයි කියනු ලැබෙයි. එහෙත් ජනතාව යැයි කියා ගන්නා පිරිසක් ඔවුන්ගේ ගමනට බාධා කරමින් පිකට්ටුවක් සංවිධානය කර ඇත. එයට දැක්වූ ප්‍රතිචාරයක් ලෙස රාජ්‍ය නොවන කුලී කරුවෝ කිලිනොච්චියෙන් පිට නොවී එහි ම රැඳී සිටිති.

ආණ්ඩුව දැන් තවත් නිවේදනයක් නිකුත් කරමින් මේ කුලියට වැඩ කරන්නන්ට සැප්තැම්බර් මස විසිහය වැනිදාට පෙර කිලිනොච්චියෙන් පිටවී යන ලෙස කියා ඇත. බටහිර රටවල්වල රටවැසියෝ ද මේ රාජ්‍ය නොවන කුලීකරුවන් අතර වෙති. එක්සත් ජාතීන්ගේ සංවිධානය කියන්නේ ඔවුන් මේ සම්බන්ධයෙන් කිසිවකුටවත්  කිසිවක් නොකියන බව ය. රාජ්‍ය නොවන සංවිධාන ද, එක්සත් ජාතීන්ගේ සංවිධානය ද, ප්‍රභාකරන් ද නටන්න යන නැටුම පැහැදිලි ය.

ප්‍රභාකරන් ඇතුළු කොටි ත්‍රස්තවාදීහු කිලිනොච්චි සටන තම අන්තිම සටන බව දනිති. මේ සටන ජයග්‍රහණය කිරීමට බැරි නම් අඩු තරමින් පරාජය නොවී සිටීම ප්‍රභාකරන්ගේ අරමුණ වෙයි. මෙහි දී ප්‍රභාකරන්ට ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන යනු එල්ලෙන්නට ඇති අන්තිම පිදුරු ගහ වෙයි. ඔහු හා ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන එක් වී අද ජනතාව මෙන් ම ඒ සංවිධානවල කුලීකාර වැටුප් සේවකයන් ද මිනිස් පළිහක් ලෙස යොදා ගැනීමට කටයුතු කරති. අවශ්‍ය නම් බටහිර හමුදාවලට රට ඇතුළට ඒමට පරිසරයක් ගොඩ නගති.

මෙයට කලින් වතාවක ජාත්‍යන්තර රාජ්‍ය නොවන කුලීකරුවන් පිරිසක් මුතූර් හි දී ආණ්ඩුව හා හමුදා අපකීර්තියට පත්කරවන සේ ක්‍රියාකළහ. අවාසනාවන්ත ලෙස ඒ අය මරණයට පත්වූයේ ඔවුන්ගේ ස්වාමිවරුන් ගත් තීරණයක් අනුව මුතූර් ප්‍රදේශයට අනවශ්‍ය මොහොතක ගොස් රැඳී සිටි බැවිනි. ඒ සම්බන්ධයෙන් පත්කරන ලද කොමිසමක් ඉදිරියේ දී මේ ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන හෙළිදරව් විය. ඔවුන් ආණ්ඩුවට හා හමුදාවට එරෙහිව ගෙනෙන ලද චෝදනා ද්වේෂසහගත බව ඔවුන්ගේ ක්‍රියාකාරීත්වයෙන් ම පැහැදිලි ලෙස ම පෙනෙන්නට තිබුණි.

ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධානවලට අද කිලිනොච්චියේ කිරීමට දෙයක් නැත. ඔවුන් කරන ඊනියා මානුෂික කටයුතුවලට  අද එහි පවත්නා තත්වය යටතේ කිසිම ඉඩක් නැත. ඔවුන් මානුෂික කටයුතු නමින් කරන්නේ කොටි ත්‍රස්තවාදීන්ට බර උපකරණ සහ වෙනත් ආධාර සැපයීම ය. ජනතාවට බෙදාදීමට යැයි කියමින් වන්නියට ගෙන ගිය බොහෝ උපකරණ හා යන්ත්‍රෝපකරණ කොටින් සඳහා ගෙන යන ලද දේ විය. ඒ හෙළිදරව් වූ පසු මේ ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන කියා සිටියේ තමන් ජනතාවට ගෙනගිය දෑ කොටින් විසින් පැහැර ගන්නා ලද බවත් ආණ්ඩුව ජනතාවට බෙදාහරින දෑ ද කොටි පැහැර ගන්නා බව ය. ඔවුන්ගේ කසිකබල් තර්කය වූයේ තම භාණ්ඩ කොටි අතට පත්වීමෙන් තමන් කොටින්ට ආධාර කරන බව කියන්නේ නම් එවිට ආණ්ඩුව ද කොටින්ට ආධාර කරන්නේ යැයි කිව හැකි බව ය.

ආණ්ඩුව ජනතාවට බෙදාහරින දෑ කොටින් විසින් පැහැර ගනු ලැබීම එකකි. කොටින්ට පැහැර ගැනීම සඳහා ජනතාවට භාණ්ඩ යැවීම තවත් එකකි. මේ දෙකෙහි ම අවසානයේ එකක් ම සිදුවන බව පෙනී ගිය ද මෙහි දී ප්‍රධාන වන්නේ චේතනාව ය. පසුගිය වසර කිහිපයෙහි ආණ්ඩුව ක්‍රියාකර ඇති ආකාරයෙන් ආණ්ඩුවේ චේතනාව කුමක් දැයි මුළු රට ම දනියි. එමෙන් ම ජාත්‍යන්තර මගඩියක් වූ ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන ආරම්භයේ සිට ම ක්‍රියාකර ඇති ආකාරයෙන් ඔවුන්ගේ චේතනාව කුමක් ද යන්න ද අපි දනිමු.

© Prof. Nalin De Silva

ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ සිංහලයන් තමන්ට සුපුරුදු ආකාරයට සංයුක්ත ව සිතීම මෙහි දී ඔවුන්ට විරුද්ධව යයි. එක් එක් සංවිධානය අසවල් ආකාරයට ක්‍රියාකර ඇතැයි නොකියා ඒ පිලිබඳ සමස්තයක් ලෙස බැලිය යුතු ය. මේ සංවිධාන, බටහිරින් නඩත්තුවන ඊනියා මානව හිමිකම් සංවිධාන ආදිය පිහිටුවා ඇත්තේ ම අප වැනි රටවලට විරුද්ධව ක්‍රියා කිරීමට ය. ආසියා අප්‍රිකා රටවලට යම් දේශපාලන නිදහසක් ලබාදීමෙන් පසුව ඒ රටවල දේශපාලනය යම් ප්‍රමාණයකට හෝ තව දුරටත් තමන් අත ම තබා ගැනීම සඳහා ආයතන රාශියක් පසු කලෙක බටහිරයෝ පිහිටු වූහ. පාසල් හා විශ්වවිද්‍යාල ඔස්සේ බිහිවන බටහිර ගැති බටහිර ප්‍රවාද ඔස්සේ හිතන  පිරිසට අමතර ව ක්‍රියාකාරීව ම බටහිරයන්ට අවශ්‍ය දේශපාලන, සංස්කෘතික න්‍යාය පත්‍රය ක්‍රියාත්මක කිරීම මේ සංවිධානවල සේවය කරන දේශීය කුලීකරුවන්ගෙන් බලාපොරොත්තු විණි.

පසුගිය දශක කිහිපයෙහි හතු පිපෙන්නාක් මෙන් බිහි වූ ඊනියා සිවිල් (සිවල්) සමාජ, මානව හිතවාදී  සංවිධාන, මාධ්‍ය නිදහස  පිළිබඳ සංවිධාන, ගැටුම් නිරාකරණ සංවිධාන, සාම මණ්ඩල ආදී දහසකුත් එකක් සංවිධාන බටහිර මුදලින් පිහිටුවනු ලැබුයේ මෙරට (අනෙක් ආසියා අප්‍රිකා රටවල ද තත්වය එසේ ම ය) දේශපාලනය හැකිතාක් දුරට බටහිරයන්ට අවශ්‍ය ආකාරයට හැසිරවීමට ය. මේ සංවිධානවල ඉහලම පුද්ගලයන්ට ඉහළම වැටුප් ගෙවන බව කුමාර් රූපසිංහ වැනි අයගෙන් අසා දැනගත හැකි ය. මසකට රුපියල් ලක්ෂ දෙකක පමණ වැටුපක් යනු ඇතැමුනට සොච්චම් මුදලකි. මානව හිමිකම් රැකීම, ගැටුම් නිරාකරණය, සාමය ලබාගැනීම ආදිය එසේ මෙසේ වැඩ නොවන බවත් ඒවාට මුදල් වැයවන බවත් අපි දනිමු.

මේ සාමය කිනම් සාමයක් ද, රකින්නේ කාගෙ මානව අයිතිවාසිකම් ද ආදිය අවසානයේ දී තීරණය කරනු ලබන්නේ බටහිරයන් විසින් බව අමුතුවෙන් කිවයුතු නො වෙයි. බටහිරයන්ගෙ ම බසින් මේ සියළු ආකාරයේ සංවිධාන හැඳින්විය හැක්කේ ආසියා අප්‍රිකා රටවල සීමිත නිදහස පවා නැතිකිරීම සඳහා පිහිටුවන ලද පශ්චාත් නිදහස් සංවිධාන ලෙස ය. මේ සංවිධාන සියල්ලෙහි ම සාමාජිකත්වය සමස්ත ජනගහණයෙන් සියයට දශමයක් වත් වේ යැයි නො සිතමි. එහෙත් ඒ සංවිධානවල අයවැය ලංකාණ්ඩුවේ අයවැයෙන් සියයට දශමයකට වඩා වැඩිවිය යුතු ය. එහෙත් එයටත් වඩා ඒ සංවිධාන තම තමන්ගෙ හිතවත් ජඩමාධ්‍ය ඔස්සේ කරන බලපෑම ඉතා ඉහළ මට්ටමක වෙයි. මේ සංවිධානවල සාමාජිකයෝ සමස්තයක් ලෙස ගත්කල සිංහල බෞද්ධ විරෝධීහු වෙති. ඔවුහු බොහෝවිට එක්කෝ අබෞද්ධයෝ ය. නැතහොත් මාක්ස්වාදීහු ය. එසේත් නැතහොත් තවමත් මාක්ස්වාදය අදහන හිටපු මාක්ස්වාදීහු ය. මේ මාක්ස්වාදීහු හා හිටපු මාක්ස්වාදීහු ස්වල්ප දෙනකු බටහිර මුදලේ බලයෙන් බහුතරය මත තම සංස්කෘතික ආධිපත්‍යය පැතිරවීම කසිකබල් මාක්ස්වාදයට එකඟ ද යන්න ගැන අධ්‍යයනයක් කරනු ඇතැයි බලාපොරොත්තු විය නොහැක්කේ අනුකාරකයන්ට කළහැකි අධ්‍යයනයක් නොමැති බැවිනි.

අද කිලිනොච්චියේ ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධානවල අරමුණ වී ඇත්තේ එහි රැඳී සිට ආණ්ඩුව හා හමුදාව අසීරු තත්වයකට පත්කිරීම ය. හමුදා ප්‍රහාරයකට හසු වී මේ කුලීකරුවන් (ඔවුන් අතර බටහිර රටවල වැසියෝ ද වෙති) කිහිප දෙනකු මියගියහොත් තම රටවැසියන්ගෙ ආරක්ෂාවට යැයි කියමින් බටහිරයන් අප රටට හමුදා එවීමට වුව ද ඉඩ ඇත. බටහිරයන්ට තම දේශපාලන අරමුණු ඉටුකරගැනීම සඳහා තම රටවැසියන් වුව ද බිල්ලට දීමට හැකි ය. එසේත් නැතහොත් කොටි විසින් බලයෙන් රඳවා ගෙන සිටින අහිංසක දෙමළ වැසියන් මියගියහොත් එවැනි ම දෙයක් කිරීමට බටහිරයන් කෙළ හළමින් සිටිනවා විය හැකි ය. අනෙක් අතට ජාත්‍යන්තර රාජ්‍ය නොවන කුලීකරුවන් වන්නියේ සිටීම කොටින්ට සෘජුව ම වැඩදායක ය. කොටි විසින් කළයුතු සන්නිවේදන හා වෙනත් යටිතල පහසුකම් සැපයීම් මොවුන් ලවා කරවාගෙන කොටි ත්‍රස්තතවාදීන්ට හමුදාවට එරෙහිව පහරදීමට තම මුළු ශක්තිය ම යෙදවිය හැකි ය.  කුලීකරුවන් ද හමුදාවට විරුද්ධව පහරදීම්වලට වුවත් ඇතැම් විට සහභාගි වනවා විය හැකි ය. ඒ කුමක් වුවත් මේ අන්තිම මොහොතේ හෝ බටහිරයන්ට හා ඔවුන්ගෙ නියෝජිතයන්ට කිවයුත්තේ ලංකාවෙහි රටවල් දෙකක් අතර වූ යුද්ධයක් හෝ සිවිල් යුද්ධයක් හෝ නැති බව ය. මෙහි ඇත්තේ ආණ්ඩුවට විරුද්ධව අවි අතට ගත් ත්‍රස්තවාදීන්ට එරෙහිව ආණ්ඩුව දියත් කර ඇති මානුෂික මෙහෙයුමක් පමණ ය. එහි දී යුද්ධ පිළිබඳ ඊනියා ජාත්‍යන්තර ගිවිසුම් හා එකඟතා කිසිවක් වලංගු නොවේ.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva